ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1986 අංක 38 දරන
# විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 ඔක්තෝබර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 ඔක්තෝබර් මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

# 1986 අංක 38 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 ඔක්තෝබර් මස 29 වන දින.]

එල්. ඩී.—ඕ. 43/86.

**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 1986 අංක 38 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

කෙටි නාමය.

**2.** ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "යම් වංචනික ක්‍රියාවක් පිළිබඳව යම් තැනැත්තකු වරදකරුවකු වන බව" යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 7 දරන පනතේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

"යම් වංචනික ක්‍රියාවක් පිළිබඳව යම් තැනැත්තකු වරද කරුවකු වන බව හෝ යම් තැනැත්තකු විසින්, ශ්‍රී ලංකාණ්ඩුවේ හෝ ජනාධිපතිවරයාගේ හෝ යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ගේ, නීත්‍යනුකූල විධිතල යම් ආකාරයකින් ක්‍රියාත්මක කිරීම සඳහා නැතහොත් ක්‍රියාත්මක කිරීමෙන් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාණ්ඩුව, ජනාධිපතිවරයා හෝ ඒ පාර්ලිමේන්තු මන්ත්‍රී වරයා පෙළඹවීමේ හෝ බල කිරීමේ චේතනාව ඇතිව, වෙනත් යම් තැනැත්තකු යම් ආකාරයකින් බිය ගන්වා ඇති බව, ඔහුට බලපෑමක් කර ඇති බව හෝ ඔහුට බලකර ඇති බව හෝ ඔහු බිය ගැන්වීමට, ඔහුට බලපෑමක් කිරීමට හෝ ඔහුට බල කිරීමට සූදානම් වී ඇති බව, කුමන්ත්‍රණය කර ඇති බව හෝ තැත් කර ඇති බව".

ඒ 003080—7,225 (86/10)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.